# යේමන් ගැටුමට බලපෑ මූලික හේතු සාධක සහ ඒ හා බැඳුණු ගෝලීය දේශපාලනික න්‍යාය පත්‍රය විශ්ලේෂණය කිරීම

සී.එන්.පී. චන්ද්‍රසිරි - ජාත්‍යන්තර සබඳතා අධ්‍යයනාංශය

සීතල යුද්ධයෙන් පසුව ජාත්‍යන්තර පර්යායේ සිදුවන අභ්‍යන්තර ගැටුම්වල වර්ධනීය තත්ව හා සමගාමීව ප්‍රචණ්ඩත්වයේ ස්වභාවය ද රාජ්‍ය අභ්‍යන්තරීකරණය වන ආකාරයක් දැකගත හැකිය. බල ව්‍යූහයෙන් එහා ගිය ආගමික මූලධර්මවාදය වැනි අභ්‍යන්තර ව්‍යුහාත්මක කාරණා නිසි ලෙස ආමන්ත්‍රණය නොවීමෙන් පැවැති කලාපීය ආතතීන් තීව්‍ර කරමින් යේමන් සිවිල් යුද්ධය ආරම්භ වීම සිදු වේ. පසුකාලීනව මානව කේන්ද්‍රීය අර්බුද ව්‍යසනයකට හේතු සාධක සපයයි. "රාජ්‍ය අභ්‍යන්තර ගැටුමක් ලෙසට ආරම්භ වූ යේමන් ගැටුම ක්‍රමයෙන් දිග්ගැස්සුණු සමාජ ගැටුමක් බවට පරිවර්තනය වෙමින් වර්තමානය වන විට ගෝලීය දේශපාලනික අභිලාෂ මත ජාත්‍යන්තරීකරණය වූ ගැටුමක් බවට පත්වීම" යන කේන්ද්‍රීය ගැටලුව ප්‍රකාශනයට පත් කිරීම සඳහා උතුරු අප්‍රිකානු හා මැද පෙරදිග කලාපයේ යේමන් රාජ්‍ය ආශ්‍රිතව සිදු කරන සිද්ධි අධ්‍යයනයක් ආශ්‍රයෙන් ප්‍රාථමික දත්ත සහ ද්විතීයික දත්ත මූලාශ්‍රය පර්යේෂණ ක්‍රමවේදයට උපයුක්ත කොට ගෙන ඇත. නිකායවාදී ගතිකතා යේමනයේ ප්‍රභූ පැලැන්තිය තම බලය ආරක්ෂා කර ගැනීමේ උපාය මාර්ගික භාවිතයක් ලෙසට පවත්වා ගැනීමෙන් පැන නගින ගෝත්‍රවාදය, නිකායවාදය, තිරස් අසමානතාව, අනන්‍යතා හිමිකම සඳහා වූ තරග කිරීම යනාදී ජනවාර්ගික දුක්ගැනවිලි ප්‍රකාශ මගින් ගැටුම් ප්‍රවේශය සකස් වී ඇති බව දෘශ්‍යමාන වුවත් කේන්ද්‍රීය ගැටලුව අධ්‍යයනයේ දී ප්‍රත්‍යක්ෂ වූ තර්ක වෙනත් දිශාවකට දිශානතිගතව ඇත. එනම් ප්‍රතිවිරෝධී ජනවාර්ගික මනෝභාවය, රටේ බහුතර ප්‍රජාව සුළුතර අයිතීන් ප්‍රවේශය අවහිර කිරීම, දුර්වල රාජ්‍ය ක්‍රියාමාර්ග සහ උපායමාර්ග, මෙන්ම ගෝලීය ප්‍රජාවගේ මැදිහත්වීම සහ බලපෑම් සහගත ක්‍රියාවලි ආදී සංරචකයන් මගින් සිවිල් යුද්ධයට පෙලඹුම් සාධක ගොඩනගා ඇති බවයි. එමෙන්ම ගෝලීය ආර්ථික අන්තර්පරායත්තතාව මෙන්ම රාජ්‍යතාන්ත්‍රික සබඳතා මගින් බලවත් රාජ්‍ය පාර්ශ්ව වෙනත් රාජ්‍යයන්ගේ දේශීය පර්යායේ දේශපාලන ව්‍යූහය අකාර්යක්ෂම කිරීමෙන් රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් සඳහා උපාය මාර්ගික ප්‍රවේශ සකස් කර ගනී. එය අනෙකුත් රාජ්‍යවල මානුෂීය තත්වය අනතුරේ හෙළීමටත් ගැටුම් පාර්ශ්වකරුවන්ට ලබාදෙන මූල්‍යමය මෙන්ම මිලිටරි සහායෙන් පාර්ශ්වකරුවන්ගෙන් අභිලාෂ වෙනත් දිශාවකට දිශානතිගත කිරීමටත් හේතු වී ඇති බවයි. එකී තර්කය තහවුරු කරමින් මුල් කාලීනව දුක්ගැනවිල්ලක් ලෙසට ප්‍රකාශයට පත්වන යේමන් ගැටුමේ කැරලිකාරී පාර්ශ්වල අභිලාෂ පසුකාලීනව බලය සඳහා වූ හිමිකමක් බවට පරිවර්තනය වීමත් සමග ධනලෝභය මුල් කරගත් ස්පර්ශ වත්කම් කෙරෙහි වර්ධනය වූ අභිලාෂ මගින් ගැටුම් විපරිවර්තන තත්වයක් පෙන්නුම් කරයි. ඒ අනුව කලාපීය මැදිහත්වීම තුළ මෙය ඉරාන-සෞදි නියෝජිත යුද්ධයක් ලෙසටත්, ගෝලීය මැදිහත්වීම තුළ ත්‍රස්තවාදී, අන්තවාදී, අරගලකාරී කණ්ඩායම්වලට එරෙහි යුද්ධයක් ලෙසටත් තවදුරටත් නිර්වචනය කෙරේ.

*ප්‍රමුඛ පද: නියෝජිත යුද්ධය, දිග්ගැස්සුණු සමාජ ගැටුම, දුක්ගැනවිලි සහ ධන ලෝභය, ජනවාර්ගික අනන්‍යතාව*